# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

2076/11 – 2018 ජුනි 19 වැනි අඟහරුවාදා – 2018.06.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 271 ඒ, සපුගස්කන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මාකොළ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක ගම්/බිය/2017/160 හා 2017.06.29 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් ඉඩම් කොටසට මායිම් :

01. **කැබලි අක්ෂර 'ඒ' – දිවුල්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0345**
උතුරට: ඩී. අයි. වික්‍රමරත්න හිමිකම් කියන දිවුල්ගහවත්ත, ඩී. වී. එන්. වික්‍රමරත්න හිමිකම් කියන දිවුල්ගහවත්ත සහ එච්. එම්. කරුණාරත්න හිමිකම් කියන දිවුල්ගහවත්ත ; නැගෙනහිරට: ඩී. වී. එන්. වික්‍රමරත්න හිමිකම් කියන දිවුල්ගහවත්ත සහ එච්. එම්. කරුණාරත්න හිමිකම් කියන දිවුල්ගහවත්ත සහ විශාඛා බාලිකා විද්‍යාලය ; දකුණට: විශාඛා බාලිකා විද්‍යාලය, රවිඳු ලසන්ත හිමිකම් කියන දිවුල්ගහවත්ත සහ පුද්ගලික මාර්ගය; බටහිරට: පුද්ගලික මාර්ගය සහ ඩී. අයි. වික්‍රමරත්න හිමිකම් කියන දිවුල්ගහවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2017/පීසී/123.
2018 මැයි මස 08 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 – 50

1A – G 27894 – 17 (2018/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*